# නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
3 වන මහල, අධිකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ල,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12

சட்ட வரைஞர் திணைக்களம்
3 ஆம் மாடி, நீதி அமைச்சுக் கட்டிடம்,
மீயுயர் நீதிமன்றக் கட்டிடத் தொகுதி,
கொழும்பு 12.

## LEGAL DRAFTSMAN'S DEPARTMENT
3rd Floor, Ministry of Justice Building,
Superior Courts Complex,
Colombo 12

දුරකථන/தொலைபேசி/Telephones : 435836/421039
තැ. පෙ. / அ.பெ. / P. O. Box 554
විදුලි පණිවුඩ : කෙටුම්පත්, කොළඹ
Telegrams : DRAFTSMAN, Colombo


මගේ අංකය / எனது இல. / My No. : ඩී.173/26
ඔබේ අංකය / உமது இல. / Your No. : පරි.නි.1 ඒ
දිනය / திகதி / Date : 1994.02.0[illegible]

රා.සේ.අ.අ./ලේ.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත
සිංහලට පරිවර්තනය කිරීම.

1994.01.18 දින දරණ ඔබේ ලිපිය සම්බන්ධයෙනි.

02. පනතේ සිංහල, පරිවර්තනය හා අදාළ ගෙවීම් වවුචරය මේ සමග එවා ඇත.

නීති කෙටුම්පත් සම්පාදක වෙනුවට.

–/ඩී
02.01..

# රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල

42 අංක 18,
47 අංක 23,
.. ආඥාපනත්
52 අංක 33,
54 අංක ,46,
61 අංක 52,
64 අංක 35,
65 අංක 18,
.. පනත් .. 38,
.. සභාවේ
75 අංක 37,
78 අංක 32,
.. පනත්.

අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම සඳහා ද විශ්‍රාම වැටුප් නොලැබෙන රජයේ ඇතැම් සේවකයන් හට එයින් ප්‍රතිලාභ ප්‍රදානය සඳහා ද, ඉහත කී කාර්ය හා සම්බන්ධ වූ හෝ අදාළ වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ආඥාපනතකි.

( 1942 අප්‍රේල් මස 1 වන දින)

..ඩු නාමය.

1. මේ ආඥාපනත රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

..රමුදල පිහිටුවීම
(1961 අංක52, වූ.2)

2. (1) ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින, මාසික අනුප්‍රමාණ මත වේතනය ගෙවනු ලැබිය යුතු විශ්‍රාම වැටුප් නොලබන සෑම සේවා නියුක්තයකු ම සඳහා මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි ප්‍රතිලාභ ප්‍රදානය කිරීම පිණිස රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල නමින් හඳුන්වනු ලබන අරමුදලක් මෙයින් පිහිටුවනු ලැබේ. ඒ සේවානියුක්තයා මින් මතු මෙම ආඥාපනතෙහි "විශ්‍රාම වැටුප් නොලබන සේවානියුක්තයකු" ලෙස හඳුන්වනු ලැබේ.

..රා: 1975
..අංක 37, වූ.2)

(2) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් විධාන කරනු ලබන ආකාරයකට අරමුදල සඳහා සාමාන්‍ය ගිණුමක් ද අරමුදලෙහි එක් එක් දායකයා සඳහා වෙනම ගිණුමක් ද විවෘත කොට පවත්වා ගෙන යා යුතු ය.

(1964 අංක 35, වූ.2.)

(3) මේ ආඥාපනතේ කාර්ය සඳහා මෙහි පහත සඳහන් එක් එක් තැනැත්තා ආණ්ඩුවේ සේවයෙහි විශ්‍රාම වැටුප් නොලබන සේවානියුක්තයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ එක් තැනැත්තා ට වේතන වෙනුවට ගෙවනු ලබන මාසික දීමනාව වේතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය :-

අග්‍ර විනිශ්චයකාරවරයාගේ පෞද්ගලික ලේකම්.

අග්‍ර විනිශ්චයකාරවරයා හැර වෙනත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකුගේ පෞද්ගලික ලේකම්.

අභියාචනාධිකරණයේ සභාපතිවරයාගේ හෝ වෙනත් විනිශ්චයකාරවරයකුගේ පෞද්ගලික ලේකම්.

:රා:1978 අංක32, §.2)

(4) මේ ආඥාපනතේ කාර්ය සඳහා උප තැපැල් ස්ථානාධිපති තනතුර දරන තැනැත්තකු ආණ්ඩුවේ සේවයෙහි විශ්‍රාම වැටුප් නො ලබන සේවා නියුක්තයකු ලෙස සලකනු ලැබිය යුතු අතර එවැනි තැනැත්තකුට වේතන වෙනුවට ගෙවනු ලබන මාසික දීමනාව මාසික වේතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පා:රා:1975 ...ං 37 §.2)

(5) මේ ආඥාපනතෙහි කුමක් සඳහන්ව ඇත ද ශ්‍රී ලංකාවේ යම් එතර දූත මණ්ඩලයක සේවයේ නියුක්ත ශ්‍රී ලංකාවේ රටවැසියකු නොවූ විශ්‍රාම වැටුප් රහිත යම් සේවකයෙක්, මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීමට ඔහුගේ ඇති බැඳීමෙන් ඔහුගේ තෑ මැත්ත පරිදි පාලන මණ්ඩලය විසින් නිදහස් කරනු ලැබිය හැකි අතර ඔහු එසේ නිදහස් කරනු ලැබූ දිනට පෙර එම තැනැත්තා මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවන්නකුව සිටි අවස්ථාවක දී අරමුදලෙහි ඔහුගේ ගිණුම වසා දැමිය යුතු ය; තව ද ඔහුගේ ගිවිසුම සතුටුදායක ලෙස සම්පූර්ණ කර සේවයෙන් අස්වූයේ නම් ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ ඔහුට ගෙවනු ලැබිය හැකි ප්‍රමාණයක මුදලක් ද ඔහුට ගෙවිය යුතු ය.

උපාධිධරයන්ගේ මාසිකව වැටුප් ගෙවනු ලැබූ තනතුරුවල පූර්ව සේවාවන්, සේවය ලෙස සැලකිය යුතු බව.

:රා:1975අංක37, §.3]

2අ. විශ්ව විද්‍යාලයක උපාධිධරයකු වූ ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරුවා වූ ද යම් තැනැත්තෙක් උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ පුහුණුවක් ලැබීම සඳහා එම තනතුරින් ඉල්ලා අස් වී එම පුහුණුවීමේ කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ආණ්ඩුව යටතේ මාසිකව වැටුප් ගෙවනු ලබන තනතුරකට පත් කරනු ලැබූ අවස්ථාවක, ආණ්ඩුව යටතේ මාසිකව වැටුප් ගෙවනු ලබන තනතුරක එම තැනැත්තාගේ පූර්ව සේවය මෙම

ආඥාපනත යටතේ දායක මුදල් ගෙවිය යුත්තේ යම් සේවයක් සම්බන්ධයෙන් ද එවැනි සේවයක් ලෙස සළකනු ලැබිය යුතු අතර ඒ අනුව එම තැ නැත්තාගේ පූර්ව සේවයට සහ එම සේවය සම්බන්ධයෙන් මෙ ආඥාපනතෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

මුදල පාලනය පරිපාලනය ම.

3. (1) අරමුදලෙහි පාලනය හා කළමනාකරණය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත මණ්ඩලයකට මෙයින් පවරනු ලැබේ. එනම් –

(අ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා ;

(ආ) සොලිසිටර් ජනරාල්වරයා ;

(ඇ) එක් එක් තැනැත්තා රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියකු හෝ ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ නියෝජ්‍ය නැතහොත් ප්‍රධාන සහකාර වන තැනැත්තන් දෙදෙනකු; සහ

(ඈ) අරමුදලට දායක වූ එක් තැනැත්තකු.

(2) (1) වන උපවගන්තියෙහි (ඇ) හා (ඈ) ඡේදවල සඳහන් කරනු ලැබූ තැ නැත්තන් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය.

(3) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ ය.

අරමුදලට අනිවාර්යයෙන් ගෙවිය යුතු දායක මුදල් (ජා:රා. 1975 අංක 37, වගන්තිය 4)

4. (1) විශ්‍රාම වැටුප් රහිත සෑම සේවකයකු ම ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක, ආණ්ඩුවෙහි ඔහුගේ සේවය අවසන් වනතුරු අනිවාර්ය දායක මුදලක් වශයෙන් එක් එක් මාසයේ දී ගෙවිය යුතු ය.

(2) යම් මාසයක වේතනය වශයෙන් ලැබුණු මුදල මාසික වේතනයට අඩුව තිබීම හෝ ඒ මාසය වෙනුවෙන් වේතනය වශයෙන් කිසිම මුදලක් නොලැබ තිබීම ගැන නොතකා යම් මාසයක් සඳහා විශ්‍රාම වැටුප් රහිත සේවයකුගේ අනිවාර්ය දායක මුදල ඒ සේවකයාගේ මාසික වේතනය අනුව ගනන් බලනු ලැබිය යුතු ය :

එසේ වුව ද දායකයකු නොකඩව ම මාස දෙකකට වැඩි කාල පරිච්ඡේදයකට අර්ධ වේතනයක් ලබන්නා වූ හෝ වේතනයක් නොලබන්නා වූ හෝ අවස්ථාවක, මාස දෙකකට වැඩි වන කාලපරිච්ඡේදයේ ඒ කොටස සම්බන්ධයෙන් ඔහුට ලැබෙන යම් වේතනයකින් සීයයට හයය බැගින් ගෙවීමට ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් රහිත සේවකයකු විසින් ගෙවිය යුතු යයි නියම කර ඇති හෝ බලය දී ඇති දායක මුදල එම සේවකයාගේ වේතනයෙන් අඩු කරගෙන අරමුදලට ගෙවිය යුතු ය.

ලට ාවෙන් ලබන මුදල්, න: 1975 37, 5)

(5) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව සහ නියම කළ හැකි කොන්දේසිවලට යටත්ව විශ්‍රාම වැටුප් රහිත සේවකයකු විසින් ඔහුගේ අනිවාර්ය දායක මුදලට අතිරේකව ඔහුගේ මාසික වේතනයෙන් සීයයට හයකට වැඩි නොවන මුදලක් ස්වේච්ඡා දායක මුදලක් වශයෙන් අරමුදලට ගෙවනු ලැබිය හැකි ය.

එසේ වුව ද එවැනි ස්වේච්ඡා දායක මුදලක් ගණන් බලනු ලබන ප්‍රමාණය, අර්ධ වාර්ෂික අන්තරයන්හි හැර වෙනස් නොකළ යුතු ය.

මුදල්.

*7. (1) එක් එක් මුදල් වර්ෂයක් අවසානයේ දී මුදල් වර්ෂය තුළ සියලු දායකයන් විසින් ගෙවනු ලැබූ අනිවාර්ය දායක මුදල්වල එකතුව මෙන් එකහමාරක ගුණයකට සමාන මුදලක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් අරමුදලෙහි පොදු ගිණුමට බැර කළ යුතු ය; තව ද දායකයකු විසින් ඒ මුදල් වර්ෂය තුළ දී අනිවාර්ය වශයෙන් ගෙවනු ලැබූ දායක මුදල්වල එකතුව මෙන් එකහමාරක ගුණයට සමාන මුදලක් එක් එක් දායකයාගේ ගිණුමට තාවකාලික වශයෙන් බැර කළ යුතු ය.

(2) දායකයකුගේ ගිණුමට එසේ බැර කරනු ලැබූ මුදල් ප්‍රමාණය ප්‍රසාද මුදල් වශයෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

න් සහතික ී ගෙවනු මුදල් වනු දායා දල් න් සල යුතු ය.

8. (1) 4 වන වගන්තිය යටතේ අනිවාර්ය සම්පූර්ණ දායක මුදල හෝ ඉන් යම් කොටසක් වෙනුවට, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකාරයට හා කොන්දේසිවලට යටත්ව, ඔහුගේම ජීවිතය සම්බන්ධව රක්ෂණ සහතිකයන් සඳහා ඒ සමාන මුදලක් සෑම දායකයකු ම විසින් ගෙවිය හැකි ය.

---

*1961 අංක 52 දරන පනත මගින් 6 වන වගන්තිය සංශෝධනය කරන ලදී

(2) ඒ ගෙවීම 7 වන වගන්තිය යටතේ වූ යම් ප්‍රසාද මුදලක් ගණන් බැලීමේ කාර්යය සඳහා අරමුදලට ගෙවනු ලැබූ දායක මුදලක් ලෙස සලකනු ලැබිය යුතු නමුත් 11, 12 හා 14 වන වගන්ති යටතේ පොලී ගණන් බැලීමේ හෝ ගෙවීමේ කාර්යය සඳහා එසේ සලකනු නොලැබිය යුතු ය.

(3) ජීවිත රක්ෂණ සහතිකයක් වෙනුවෙන් හෝ සම්බන්ධයෙන් ගෙවන කිසිදු වාරික මුදලක්, ඒ වාර මුදල ගෙවනු ලබන අවස්ථාවේ දී රක්ෂණ සහතික පවරනු ලැබ ඇත්නම් හෝ යම් උකස් කිරීමකට හෝ කවර වූ හෝ බැඳීමකට යටත් ව තිබේ නම්, (1) වන උපවගන්තිය යටතේ අරමුදලට ගෙවනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "ජීවිත රක්ෂණ සහතිකය" යන්නෙන් දායකයකුගේ මරණයෙහි දී හෝ ඔහුගේ වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ වීමේ දී හෝ රක්ෂණ සහතිකයෙහි සඳහන් කරන ලද යම් වැඩි වයසකදී නියමිත මුදලක් ගෙවීම සහතික කරන, මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ රක්ෂකයකු විසින් දායකයා වෙත නිකුත් කරනු ලැබූ රක්ෂණ සහතිකයක් අදහස් වේ.

මුදලට ගෙවන
මුදල් ආයෝජන
ම.

9. අරමුදලට ගෙවන ලද මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින, මණ්ඩලයේ අනුමතය ඇතිව, මුදලින් සමන්විත වන්නා වූ භාර දේපළ ආයෝජනය කිරීම සඳහා භාර ආඥාපනතේ 20 වන වගන්තියෙහි නියමිත සුරැකුම්වල ආයෝජන කරනු ලැබීම, ප්‍රායෝගික වනතාක් දුරට යුතු ය.

මුදල පිහිටුවීමේ
දම් එකාබද්ධ
මුදලින් දැරිය
බව.

10. (මෙහි මින් මතු" පිහිටුවීමේ වියදම්" නමින් හඳුන්වනු ලබන) අරමුදල පිහිටුවීමේ වියදම් සහ කළමනාකරණය සහ පරිපාලනය කිරීමට ආනුෂංගික වන වෙනත් වියදම් 11(3) වන වගන්තියේ සඳහන්

ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවීමට යටත්ව ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු ය.

...දලේ ගිණුම් ...හා කිරීම හා ... හෝ ...ය බෙදා ... කිරීම.

11. (1) එක් එක් වර්ෂයක දෙසැම්බර් මස තිස් එක් වන දිනට පසු හැකිතාක් ඉක්මනින් මණ්ඩලය විසින් ඒ දිනයෙහි අරමුදලේ පොදු ගිණුම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට සැලැස්විය යුතු අතර, ඒ දිනයෙන් අවසාන වන මුදල් වර්ෂය සඳහා ලැබූ ලාභය හෝ සිදු වූ අලාභය නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ පරීක්ෂණයෙන් යම් මුදල් වර්ෂයක් සඳහා අලාභයක් අනාවරණය කෙරෙන අවස්ථාවක, ඒ මුදල් වර්ෂය අවසානයේ දී දායකයන්ගේ බැරට පවත්නා මුදල්වලට සමානුපාතිකව ඔවුන්ගේ ගිණුම්වලට මණ්ඩලය විසින් හර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් පරීක්ෂණයෙන් යම් මුදල් වර්ෂයක් සඳහා ලාභයක් අනාවරණය කෙරෙන අවස්ථාවක, හැකි තාක් දුරට මෙහි මින්මතු දක්වනු ලබන කාර්ය සඳහා සහ පිළිවෙලින් ඒ කාර්ය සඳහන් කරනු ලැබූ අනුපිළිවෙළ අනුව මණ්ඩලය විසින් ඒ ලාභ බෙදා වෙන් කරනු ලැබිය යුතු ය :-

(අ) ඒ මුදල් වර්ෂය අවසානයේ දී දායකයන්ගේ බැරට පවත්නා මුදල්වලට සමානුපාතිකව ඔවුන්ගේ බැරට එසේ පවත්නා මුදල්වලින් සියයට දෙකහමාරක උපරිමය දක්වා ඔවුන්ගේ ගිණුම්වලට පොළිය ගෙවීම ;

(ආ) ඒ මුදල් වර්ෂය වෙනුවෙන් වන පිහිටුවීමේ වියදම් ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවීමට ;

(ඇ) ඒ මුදල් වර්ෂය අවසානයේ දී දායකයන්ගේ බැරට අරමුදලෙහි පවත්නා මුදල්වලට සමානුපාතිකව ඔවුන්ගේ ගිණුම්වලට පොලිය ගෙවීම.

——————— දායකයන්ගේ බැරට අරමුදලෙහි පවත්නා මුදල්වලට, සියයට පූර්ණ සංඛ්‍යාවක, භාගයක, කාලක හෝ එම සියයට ගණන්වල සංයෝජනයක යන සියයට ගණනක වන්නාවූත් කෙසේ වුව ද ඊට වඩා කුඩා භාගයන් නොවන්නා වූත් සියයට ගණනක පොලියක් ගෙවීමට (අ) සහ (ඇ) ඡේදය යටතේ බෙදා වෙන් කරන ලද මුදල් ප්‍රමාණවත් විය යුතු ය. සියයට කාලක පොලියක් ගෙවීමට ප්‍රමාණවත් නොවන ලාභ මුදලක් ඊළඟ මුදල් වර්ෂය සඳහා ඉදිරියට ගෙන යා යුතු ය.

12. දායකයකුගේ ගිණුමට ගෙවනු ලැබිය යුතු පොලිය, අනිවාර්ය දායක මුදල්වලට, ස්වේච්ඡා දායක මුදල්වලට හා ප්‍රසාද මුදල්වලට වෙන වෙනම බැර කරනු ලැබිය යුතු අතර, එක් එක් ප්‍රසාද මුදලක් සහ ගෙවනු ලැබූ එක් එක් දායක මුදලක් සම්බන්ධයෙන් දායක මුදල් ගෙවනු ලැබූ හෝ ප්‍රසාද මුදල් බැර කරනු ලැබූ දිනයෙන් පසු එළඹෙන ඊළඟ මාසයෙහි පළමුවන දිනයේ දී උපචිත වීම ආරම්භ විය යුතු ය. ඒ පොලිය එක් එක් වර්ෂයක දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනට ගණන් බැලිය යුතු අතර, මුල් මුදලට එකතු කරනු ලැබ, එහි කොටසක් විය යුතු ය. මේ ආඥාපනතේ කාර්ය සඳහා, ඒය අවස්ථාවෝචිත පරිදි, අනිවාර්ය දායක මුදල, ස්වේච්ඡා දායක මුදල හෝ ප්‍රසාද මුදල වශයෙන් සලකනු ලැබිය යුතු ය.

වසා දැමීම.
(51 අංක 52, 6)

13. (1) දායකයකු මිය යාමේ දී හෝ යම් මුදල් වර්ෂයක යම් දිනයක දී විශ්‍රාම වැටුප් නොලබන යම් ධූරයක දායකයාගේ සේවය අවසාන කිරීමේ දී -

(අ) ඉහතින් ම වූ මුදල් වර්ෂය සම්බන්ධයෙන් එම දායකයාගේ ගිණුමට පොළිය බැර කරනු ලැබූ අනුපාතිකය අනුව ගණන් බලනු ලැබූ ප්‍රමාණය අනුව ඒ දිනයට පෙරාතුවම වූ මාසයෙහි අවසානය තෙක් පොළිය ; සහ

(ආ) ඔහු මිය ගිය විටෙක, හෝ 14 වන වගන්තිය අදාළ වන්නා වූ යම් අවස්ථානුගත කරුණුවල දී ඔහුගේ සේවය අවසාන කරනු ලැබූ විටෙක, ඒ මුදල් වර්ෂය තුළ දායකයා විසින් ගෙවනු ලැබූ අනිවාර්ය දායක මුදල් මෙන් එකහමාරක ගුණයකට සමාන ප්‍රසාද මුදලක් ඒ මුදල් වර්ෂය සඳහා,

ඔහුගේ ගිණුමට බැර කළ යුතු අතර ඒ ගිණුම වසා දැමිය යුතු ය:

(51 අංක 52, 6)

එසේ වුව ද, ඒ දිනයට පෙර ඒ දායකයාගෙන් අය විය යුතු 4 වන වගන්තිය යටතේ වූ යම් දායක මුදලක් ඒ දිනයට පෙර අරමුදලට නොගෙවා ඇති විට, මේ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදයන්හි සඳහන් පොළිය හා ප්‍රසාද මුදල් ඔහුගේ ගිණුමට බැර කළ යුතු නමුත් ඒ දායක මුදල ඔහුගේ වැටුපෙන් අඩු කර අරමුදලට ගෙවනු ලැබිය හැකි වන සේ හෝ අන් ලෙසකින් අරමුදලට ගෙවනු ලැබිය හැකි වන සේ මණ්ඩලය විසින් තීරණය කළ හැකි කාලය තෙක් ඒ ගිණුම වසා නොදැමිය යුතු ය. තව ද ඒ ගිණුම වසා දැමීමට පෙර ඒ දායක මුදල අරමුදලට ගෙවනු ලැබුවහොත්, ඒ දායක මුදල මෙන් එකහමාරක් මුදලක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් අරමුදලට බැර කළ යුතු අතර

[illegible] ඒ දායක මුදල මෙන් එක හමාරකට සමාන ප්‍රසාද මුදලත් ඒ ගිණුමට බැර කොට, ඉන්ඉක්බිතිව ඒ ගිණුම වසා දැමිය යුතු ය.

(2) ඉක්බිතිව ම ඒ පියවීම සම්බන්ධ දැනුම්දීම –

(1) දායකයා ජීවත් වන්නේ නම්, දායකයාට ; හෝ

(11) දායකයා මිය ගොස් ඇත්නම්, නිසි පරිදි දැනුම් දිය යුතු යයි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට පෙනී යන 17 වන වගන්තියේ සඳහන් තැනැත්තාට හෝ තැනැත්තන් හට ; සහ

ඒ අවස්ථා දෙකෙන් කවර හෝ අවස්ථාවක වුව ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ මතය අනුව ඒ දැන්වීම සාධාරණ ලෙස අවශ්‍ය හෝ අවශ්‍ය විය හැකි වෙනත් යම් තැනැත්තන් හට දිය යුතු ය.

යාමේ දී හෝ
ය අවසාන
මී දී ප්‍රතිලාභය
ම.
61 අංක 52, 7)

14. මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, දායකයකු ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින අතරතුර මියගියහොත් හෝ පහත සඳහන් යම් අවස්ථානුගත කරුණක දී සේවය අතහැර යයි නම් :–

(1) ජනාධිපතිවරයා සෑහීමට පත් වන පරිදි නැතහොත් දායකයා විශ්‍රාම ගැන්වීමට නියම කිරීම ඔහු සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානයාට බලය ඇති අවස්ථාවක, යම් කායික හෝ මානසික දුබලතාවක් හේතුවෙන් ස්වකීය ධුරයට අයත් කාර්ය ඉටු කිරීමට ඔහු අපොහොසත් බව ඒ දෙපාර්තමේන්තු ප්‍රධානයා සෑහීමට පත් වන පරිදි වෛද්‍ය සාක්ෂි මත විශ්‍රාම ගැනීම ;

(2) සතුටුදායක ලෙස ගිවිසුම සම්පූර්ණ කර තිබීම ;

(3) ධූරය අහෝසි කිරීම ;

(4) වයස නිසා විශ්‍රාම ගැනීම ;

(5) ඉවත් කිරීම හැර අන්‍යාකාරයකින් ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුවේ කැමැත්ත ඇතිව ගිවිසුම අවසාන කිරීම ;

(6) අවුරුදු තුනකට නොඅඩු කාලයක සේවයෙන් පසු ස්ථිර දායිකාවක විවාහ වීමට බලාපොරොත්තුව හෝ විවාහය හේතු කොට ගෙන (විශ්‍රාම ගැනීමෙන් පසු නියම කළ හැකි කාලයක් ඇතුළත විවාහය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව) විශ්‍රාම ගැනීම ;

:රා:1975 අංක 37, 6)

(7) ඉහතින් වූ ඡේදවල සඳහන් හේතු හැර වෙනත් හේතු මත, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීම,

ඒ ගිණුම වසා දැමීමේ දී අරමුදලෙහි ඔහුගේ හෝ ඇගේ බැරට පවත්නා මුදල් ප්‍රමාණය මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, දායකයාට නැතහොත් මේ ආඥාපනත ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් නීත්‍යානුකූලව ගෙවීම කරනු ලැබිය හැකි ඒ වෙනත් තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, අරමුදලේ ඔහුගේ හෝ ඇගේ බැරට පවත්නා අනිවාර්ය දායක මුදල්වල, ප්‍රසාද මුදල්වල හා ඒ මත පොලීවල එකතුව –

(අ) දායකයා විසින් අරමුදලට ගෙවනු ලැබූ අනිවාර්ය දායක මුදල්වල;

(ආ) අරමුදලේ දායකයාගේ ගිණුමට බැර කරනු ලැබූ ප්‍රසාද මුදල්වල; සහ

(ඇ) දායකයා විසින් අරමුදලට ගෙවනු ලැබූ අනිවාර්ය දායක මුදල් හා අරමුදලෙහි ඔහුගේ ගිණුමට බැර කරනු ලැබූ ප්‍රසාද මුදල් වෙනුවෙන් අවුරුද්දකට සියයට දෙකහමාර ගණනේ බැගින් වූ වැල් පොලියේහි,

එකතුවට වඩා අඩු වූ විටෙක ඒ එකතුවන් දෙකෙහි අන්තරයට සමාන මුදලක් දායකයා ට හෝ මෙ ආඥාපනත ප්‍රකා ර හෝ අන්‍යාකා රයකින් නීත්‍යානුකූල ගෙවීම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකුට ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සේවානියුක්තයකු ...ධයෙන් වූ විට ...වන වගන්තියේ (6) වන ... වෙනස් කිරීමේ බලය.

15. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය හැකි එවැනි යම් පංතියකට නැතහොත් විස්තරයකට අයත් දා යිකා වක සම්බන්ධයෙන් වූ විට, 14 වන වගන්තියේ (6) වන ඡේදයෙන් අවශ්‍ය කරන්නා වූ අවම සේවය, එම ඡේදයෙහි සඳහන් අවුරුදු තුනක සේවය වෙනුවට අවුරුදු පහක සේවයක් බව හා එවැනි සෑම අවස්ථාවක ද ම, එම ඡේදයෙහි විධිවිධාන එපරිද්දෙන් අදා ළ විය යුතු බව රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

...වන වගන්තිය අදාළ අවස්ථා හැර යම් ...වල දී සේවයෙන් ...කිරීමේ දී, සේවය ...කිරීමේ දී හෝ ...න් කිරීමේ දී ප්‍රතිලා භ ...ම.

16. මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, අකාර්යක්ෂම භාවය හෝ විෂමා චා රය යන හේතුව මත, දා යකයකු සේවයෙන් පහ කරනු ලබයි නම් හෝ සේවය නතර කරනු ලබයි නම් නැතහොත් 14 වන වගන්තිය අදාළ වන්නා වූ අවස්ථා හැර, යම් අවස්ථාවල දී ආණ්ඩුවේ සේවයෙන් අස්වී යන්නේ නම් –

(ඇ) අරමුදලට ඔහු විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය හා ඒ සම්බන්ධයෙන් වූ පොලිය දායකයාට ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) දායකයාගේ හිණුමට හා වකාලීන ලෙස බැර කරන ලද සියලු ප්‍රසාද මුදල් හා ඒ සම්බන්ධයෙන් වූ පොලිය, ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු ය:

(ජා:රා:1975 අංක 37, වූ. 7)

එසේ වුව ද යම් විශේෂ කාරණයක විශේෂ අවස්ථාවක දී, එම ප්‍රසාද මුදල සහ පොලිය හෝ එයින් යම් නිශ්චිත කොටසක් දායකයාට ගෙවිය යුතු යයි අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි විධාන කරනු ලැබිය හැකි ය.

දායකයා මියගිය අවස්ථාවක ගෙවීම.
(ජා:රා:1975අංක37 වූ. 8)

17. (1) දායකයකු මියගිය අවස්ථාවක, මේ ආඥාපනතෙහි විධිවිධානවලට යටත්ව –

(අ) ගෙවිය යුතු මුදල රුපියල් විසි දහසකට වැඩි නොවන්නේ නම් නියම කර ඇති ආකාරයට එම කාර්යය සඳහා දායකයා විසින් නම් කරනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ට නැතහොත් එසේ නම් කිරීමක් කර නොමැති නම් මියගිය දායකයාගේ මුදලයේ බැරට, හෝ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ අභිමතය පරිදි නීතියෙන් ඒ මුදල ලැබීමට හිමිකම් ඇතැයි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට පෙනී යන තැනැත්තාට හෝ තැනැත්තන්ට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ඒ මුදල ගෙවිය යුතු ය ;

(ආ) ගෙවිය යුතු මුදල රුපියල් විසි දහසට වැඩි වන්නේ නම් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ඒ මුදල මියගිය

දායකයාගේ මුදලයේ බැරට ගෙවිය යුතු ය:

එසේ වුව ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ මතය අනුව සහනය දීම අවශ්‍ය නම් මියගිය තැනැත්තාගේ අවමංගල වියදම් සඳහා හෝ මියගිය තැනැත්තාගේ වැන්දඹුවට, දරුවන්ට හෝ වෙනත් යැපෙන්නන්ට වහාම සහනය දීම සඳහා හෝ යම් එක් වතාවක දී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් රුපියල් එක් දහසකට නොවැඩි මුදලක් ගෙවිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ගෙවනු ලැබූ යම් ගෙවීමක් ඒ දායකයා සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල පිළිබඳ වෙන යම් තැනැත්තකු විසින් ආණ්ඩුවට, මණ්ඩලයට හෝ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට විරුද්ධව කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වලංගු විය, යුතු ය. බලපැවැත්විය යුතු ය.

...ද මුදල් ආදිය ...බද්ධ අරමුදලට ... බරක් විය යුතු

18. ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හෝ ඉන් ගෙවීමට මේ ආඥාපනතින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබූ සියලු ප්‍රසාද මුදල් හා වෙනත් මුදල් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

...වාර්ය දායක මුදල් ...ය පැවරීම හෝ ...මට ගැනීම නොකළ ... බව.

19. මේ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, කිසිදු අනිවාර්ය දායක මුදලක්, ප්‍රසාද මුදලක් හෝ එවැනි යම් දායක මුදලක් නැතහොත් ප්‍රසාද මුදලක් සම්බන්ධයෙන් වූ පොලිය, පවරා දීම හෝ හිමිකර දීම නැතහොත් යම් ණයක් හෝ කවරාකාර වූ හිමිකම් පෑමක් වෙනුවෙන් හෝ සම්බන්ධයෙන් යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් නැතහොත් ආඥාවක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා තහනමට ගැනීමට, බලකර ලබා ගැනීමට හෝ අය කර ගැනීමට යටත් කිරීම කරනු නොලැබිය යුතු ය .

ව
ී
වැටුප්
ධුරයකට
කා පත් කිරීම.
(රු:1975අංක 37 දු9)

20. අරමුදලේ දායකයකු, රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධුරයකට පත් කරනු ලැබ, ඒ ධුරයෙහි කාර්ය භාරය ගන්නා අවස්ථාවක –

(අ) ඒ දායකයා ඔහුගේ අලුත් ධුරයෙහි කාර්ය භාර ගන්නා දිනයෙහි ඔහුගේ ගිණුම වසා දැමිය යුතු ය ;

(ආ) ප්‍රසාද මුදල් සම්බන්ධයෙන් ලැබුණු පොලියත් සමඟ ඒ දායකයාගේ ගිණුමට ආණ්ඩුව විසින් බැර කරනු ලැබූ ප්‍රසාද මුදල් ප්‍රමාණයෙහි සම්භාරය, ඒ අරමුදලින් ආණ්ඩුවට ගෙවනු ලැබිය යුතු ය; තව ද

(ඇ) දායකයා විසින් අරමුදලට ගෙවනු ලැබූ යම් අනිවාර්ය දායක මුදල් හා ස්වේච්ඡා දායක මුදල් වේ නම්, එහි සම්භාර ප්‍රමාණය, ඒ පොලියත් සමඟ ඒ අරමුදලින් දායකයාට ගෙවනු ලැබිය යුතු ය.

ල් ගුරුවරුන්ගේ
ම වැටුප් නියෝග
ම මුදලක් ලැබීම
ා සුදුසු බවට
න දායකයකු
ද විධිවිධාන.
961 අංක 52, දු9)

20අ. (1) සහතික කොලත් රජයේ ගුරුවරයකු වන දායකයකු 1928 පෙබරවාරි 24 වන දින අංක 7,631 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ (එහි ලා "රීති" යනුවෙන් සඳහන් කරනු ලබන) පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් නියෝග යටතේ විශ්‍රාම මුදලක් සඳහා සුදුසුකම් ලබන අවස්ථාවක –

(අ) ඒ දායකයාගේ ගිණුම එයේ ඔහු සුදුසුකම් ලබන දිනයෙහි වසා දැමිය යුතු ය ;

(ආ) ඒ දායකයාගේ ගිණුමට රජය විසින් බැර කරනු ලැබූ ප්‍රසාද මුදල්වල මුළු ගණන හා ඒ ප්‍රසාද මුදල් සඳහා ලැබුණු පොලිය ද අරමුදලෙන් රජයට ගෙවිය යුතු ය ;

(ඇ) ඒ දායකයා විසින් අරමුදලට ගෙවනු ලැබූ අනිවාර්ය දායක මුදල් හා ස්වේච්ඡා දායක මුදල් කිසිවක් ඇතොත් එහි මුළු මුදල ද ඒ දායක මුදල් සඳහා ලැබුණු පොලිය ද ඒ දායකයාට අරමුදලෙන් ගෙවිය යුතු ය; තව ද

(ඈ) ඉහත කී නියෝග යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම මුදලක කාර්යය සඳහා ගණන් ගනු ලබන සහතික කාලත් රජයේ ගුරුවරයකු වශයෙන් වූ යම් සේවයක් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඒ දායකයා හට කිසිම ප්‍රදානයක් නොකළ යුතු ය.

(2) මේ වගන්තියෙහි "රජයේ ගුරුවරයා" යන්නෙන්, 1929 අගෝස්තු 2 වන දින අංක 7,726 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබූ රජයේ පාසැල් සඳහා වූ නියෝග සංග්‍රහය යටතේ පාලනය කරනු ලබන පාසැලකට අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පත් කරනු ලබන ගුරුවරයෙක් අදහස් වේ.

21. *

[ආදායම් බදු වෙනුවෙන් අඩු කිරීම. 1965 අංක 18, [56(1)]]

*22. අරමුදලෙහි දායකයකුගේ ගිණුමේ බැරට පවත්නා මුදල් ගෙවීමට පෙර, ඒ මුදල්වලින්, ආදායම් බදු වෙනුවෙන්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් අඩු කිරීම් කරනු ලැබිය හැකි ය. එසේ අඩු කරන ලද (යම්) මුදලක් දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය. [illegible]

[15/8/[illegible] [illegible]] [illegible]

[Mr. Jayawardane (Pay as you earn / Withholding Tax) 440066.]

* [illegible] 1975 අංක 37 දරන [illegible] 21 වන [illegible] ඉවත්කරන ලදී.

වට හෝ ලෝහෝර්
අරමුදලට
යුතු මුදල්
කිරීම.
(75 අංක 37, 11)

23. දායකයකුගේ ගිණුමකට අරමුදලෙහි තිබෙන මුදල් ගෙවීමට පෙර ඒ දායකයාගෙන් ආණ්ඩුවට හෝ ලෝහෝර් ආර්යා ණය අරමුදලට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණයන් ඒ මුදල්වලින් අඩු කර ගත හැකි ය.

24. (1) අරමුදලට අයත් මුදල් සඳහා වෙන ම ගිණුමක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් තබා ගනු ලැබිය යුතු ය. ඒ ගිණුම විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසුව කළ හැකි තාක් ඉක්මනින් අරමුදලේ ක්‍රියාකාරිත්වය දැක්වෙන හා අරමුදලේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු ගනුදෙනුවල සම්පූර්ණ විස්තර ඇතුළත් පූර්ණ ප්‍රකාශයක් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

යකයන්ට දැනුම් දීම.

25. එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින්, එම දිනයේ දී අරමුදලෙහි තමාගේ බැරට පවත්නා මුළු මුදල් ප්‍රමාණය එක් එක් දායකයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

යෝග.

*27. (1) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බල ගැන්වීමේ කාර්ය සඳහා රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට

(ආ) අරමුදල කළමනාකරණය කිරීම හා පාලනය කිරීම සඳහා ;

(ඇ) මණ්ඩලය සඳහා ගණපූරණය සහ මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරන්නා වූ ;

(ඈ) දායකයන්ගේ වේතනවලින් අඩු කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටිය නියම කරන්නාවූ;

(ඉ) රත්ෂණ වාරික මුදල් ගෙවීම ඔප්පු කරනු ලැබිය හැකි හෝ සත්‍යෙපත්ෂණය කළ හැකි ආකාරය නියම කරන්නා වූ

නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ කිසිම නියෝගයක්, ඒ නියෝගය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන තෙක් බලනොපැවැත් විය යුතු ය. ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය ; තව ද එසේ පළ කරනු ලැබූ විට අදාළ වන්නා වූ නියෝගය මෙයින් පනවනු ලැබුවාක් මෙන් වලංගු සහ බලසහිත විය යුතු ය.

නිරූපණය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ආඥාපනතෙහි —

"අරමුදල" යන්නෙන්, මේ ආඥාපනතින් පිහිටුවනු ලැබූ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල අදහස් වේ ;

"දායකයා" යන්නෙන්, අරමුදලේ දායකයෙක් අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ ආඥාපනතින් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග මගින් නියමිත යන්න අදහස් වේ;

පෞද්ගලිකව ප්‍රදානය කරනු ලබන වේතනයට විශේෂ එකතු කිරීමක් අදහස් වේ;

"මණ්ඩලය" යන්නෙන් 3 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද කළමනාකරණ මණ්ඩලය අදහස් වේ;

(1971 අංක 38, 23) "මුදල් වර්ෂය" යන්නෙන්, යම් වර්ෂයක ජනවාරි මස පළමු වන දිනයෙන් ආරම්භවන දොළොස් මාසයක කාලය අදහස් වේ ;

(ජා:රා:1975 අංක 37, 12) "වේතනය" යන්නෙන් ඒකාබද්ධ වැටුප අදහස් වන අතර යම් පඩියක් සහ යම් පෞද්ගලික දීමනාවක්, එයට ඇතුළත් වන නමුත් කවර වූ හෝ වෙනත් ගෙවීමක් හෝ දීමනාවක් එයට ඇතුළත් නොවේ.